# ශ්‍රී ලංකාවේ උත්සව ඓතිහාසිකව සංවර්ධනයට පත් වු ආකාරය පිළිබඳව විමසීමක්

උත්සවය යනු ජනතා සාමුහිකත්වයේ ප්‍රතිමූර්තියකි. එය සමහර විට විනෝදය අරමුණු කොට ගත්තකි. සමහර විට ආගමික පූජාවකි නැතහොත් ශාන්තිකර්මයකි. මේ අංශ සියල්ලම එකතු වි නැටුම් ගැයුම් වලින් හා ආගමික චාරිත්‍ර වාරිත්‍රාදියෙන් පරිපූර්ණ වු උත්සවද වේ. සමහර උත්සව ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් භික්ෂු ආභාෂයෙන් ලක් ජනතාව සතු වු ඒවාය. ඒවා බොහෝ වශයෙන් පැරණි ලංකාවේ ජාතික උත්සව වශයෙන් පැවතුණි. ක්‍රි.පූ 3 වන සියවසේ බුදු දහම පැමිණිමෙන් පසු ඒවා බුදු දහම හා මිශ්‍ර විය. මහාචාර්ය තිස්ස කාරියවසම් එය ජනප්‍රිය බුදු දහමේ පුද පූජාවලින් සමන්විත චූල සම්ප්‍රදාය මඟින් ත්‍රිපිටකාගත මහ සම්ප්‍රදාය පරිපූර්ණත්වයට පත් වීමක් වශයෙන් පවසයි.

“This was how the “great tradition” of canonical Buddhism came to the complemented by the “Small tradition” of popular Buddhism consisting of the virtual and Ceremonies”

ලංකාවේ බෞද්ධ උත්සව පිළිබඳව වල්පොල රාහුල හිමි "ලක්දිව බුදුසමයේ ඉතිහාසය "16 වන පරිච්ඡේදයේ විග්‍රයක යෙදෙයි. පැරණි ගණයෙහිලා ගිණිය හැකි උත්සව කිහිපයක් පිළිබඳව එස් . කේ .ජයවර්ධන -- "පැරණි ලංකාවේ ආගමික හා පුද පූජා "නම් කෘතියේ (P 145 )විස්තර දක්වයි. ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ජාතික මට්ටමේ පැවති උත්සව වශයෙන්,

i. නැකැත් කෙළිය
ii. ගිරග්ග සමජ්ජය
iii. දියකෙළි උත්සවය
iv. උයන් කෙළිය
v. දඬ කෙළිය
vi. වප් මඟුල
vii. ඇසල උත්සවය
viii. සිංහල අවුරුදු උත්සවය යනාදිය දැක්වීමට පුළුවන.

බෞද්ධ උත්සව වශයෙන්,

i. ආරියවංශ සූත්‍ර දේශනාව
ii. වෙසක් පොසොන් වැනි පෝය දින උත්සව
iii. ඇසළ උත්සවය
iv. ගිරි භාණ්ඩ පූජා
v. ගංගාරෝහණ උත්සවය
vi. මිහිඳු උළෙල
vii. ප්‍රතිමා අභිෂේකය
viii. රාජාභිෂේකය
ix. වස් හා කඨින උත්සවය
x. ආදහන උත්සව යනාදි වේ.

ලංකා ඉතිහාසයේ මුල් යුගයේ දක්නට ලැබෙන නැකැත් කෙළිය පණ්ඩුකාභය රාජ සමයෙහි වූ කාමෝත්සවයකි. මහා වංශයේ 5 වන පරිච්ඡේදයේ සඳහන් වන මෙය කාම දෙවි චිත්‍ර රාජ පිදිමට වූ උළෙලක් බව පරණ විතාන මතයයි. රසවාහිනිය සද්ධර්මාලංකාරය වැනි කෘති වලද විස්තර වන මෙම උත්සවය පසුකාලීනව විද්‍යාමාන නොවේ.

ඉන්දියාවේ ප්‍රකට උත්සවයක් වූ ගිරග්ග සමජ්ජය ලක්දිව 7-8-9 ශතවර්ෂ වල සීගිරියේ විද්‍යාමාන වන බව පරණ විතාන මහතා අදහස් කරයි. (Sigiri Graphitic- Introduction vol I) දියකෙළි උත්සවය පණ්ඩුකාභය රජු වටා ගෙතුණු වෘතාන්ත වලද,දෙවනපෑතිස්ගේ දඩකෙළිය අවසානයේ දියකෙළියක් වූ බවද මහාවංශය 14වන පරිච්ඡේදයේ වාර්තා වේ. තිසාවැවේ දියකෙළියකදී යසලාලක තිස්ස රජු මැරුම් කැවේ යැයි එහි වාර්තා වේ. දිය ක්‍රීඩාවේ සමහර අංග භික්ෂූන්ට අකැප බව සිබවළඳ විනිස පවසයි. කෝට්ටේ යුගයේ එන සන්දේශ කාව්‍ය වලද දියකෙළි දක්නට ලැබුණත් ඒවා සංස්කෘත සාහිත්‍යාභාෂය මිස තාත්වික ලාංකික අංග ලෙස සිතීමට අපහසුය.

මුටසීව රජතුමා මහාමේඝ වනෝද්‍යානය අනුරපුරින් උතුරු දිසාවේ කරවූ බව මහාවංශය xi – 2 වාර්තා කරයි. එසේම 1 වන පරාක්‍රමබාහු රජතුමාද මගුල් පොකුණ හා උද්‍යාන කරවූ බව චූල වංශයේ සඳහන් වේ. කිත්සිරි මෙවන් රජතුමා දන්ත ධාතුව වැඩමවන විට උයන් කෙළියට ගොස් සිටි බව දාඨාවංශයේ 5වන පරිච්ඡේදය වාර්තා කිරීමෙන් එකල අනුරපුර පොලොන්නරු කාල වල උද්‍යාන ක්‍රීඩා උත්සව පැවැති බව තීරණය කළ හැකිය.

"රාජා වසන්ත සමයේ සහ කාමිනීහි
උද්‍යාන කෙළි සුඛමෙකදිනේනු භොනෙතා
ආගච්ඡමානා තතෝ සුදාරතොව
තං විප්පසන්න මුඛවණ්ණමපස්සි භික්ඛුං"

දෙවන පෑතිස් රජතුමාට මිහිඳු හිමියන් හමුවූයේ දඩයම් ක්‍රීඩාවට පොසොන් දා ගොස් සිටි අවස්ථාවක බැවින් අනුරපුර මුල් භාගයේ දඩ ක්‍රීඩාවද තිබුණි. මහාවංශය 14වන පරිච්ඡේදය

"දේවනම්පියතිසෙසා - සො රාජා සලිල කිළිතං
දත්වා නගර වාසිනං - මිගවං කිළිතුං අගා "

ජල ක්‍රීඩාවෙන් පසු මෙය කළ බව දැක්වේ. ඉන්දියාවේ ආලවක රජු හා අශෝකගේ සහෝදර තිස්ස කුමාරයාද දඩයමේ යෙදුන බව මහාවංශයේ සඳහන් කරයි. ක්‍රි.ව 2 වන සියවසේ සිංහල උත්සව දිනවල ජනප්‍රියම අංශයකි දඩයමේ යෙදිම. නමුත් බුදු දහමේ පැමිණිමෙන් පසු ආමණ්ඩ ගාමිණී වැනි රජුන් පැනවූ මාඝාත ආඥාව නිසා යම් ප්‍රමාණයකට එය අඩුවන්නට ඇතැයි කල්පනා කල හැකිය. පණ්ඩුකාභය කුමරු "ස්වර්ණ පාලිය"පැහැර ගන්නේ කෙතේ උත්සවයකට ආහාර ගෙන යද්දිය. එම නිසා වප් මඟුල් උත්සවයද එදා සිරිලක පැවතුණු බව සිතිය හැකිය.

මෙම අනුරපුර මුල් යුගයේ ජාතික මට්ටමේ පැවති උත්සව ඓතිහාසික වශයෙන් සංවර්ධනය වූ බවක් දක්නට නැත. සමහර ඒවා පොළොන්නරු යුගයේ ද විද්‍යාමාන වෙන බව ඉහත විග්‍රයෙන් පෙනිණි. නමුත් සිංහල අවුරුදු උත්සවය හා ඇසළ උත්සවය ඓතිහාසික ව වර්ධනය වෙමින් අද දක්වාම එන පෞරාණික උත්සව දෙකකි. විජයගේ පැමිණිමේ පටන්ම මෙරට පවතින ඇසල උත්සවය හෙවත් ආෂාඩ උත්සවය හින්දු ආභාෂයෙන් සුරාසුර යුද්ධය සමරමින් දෙවියන් උදෙසා පවත්වන්නක් බව රැල්ෆ් පිරිස් "සිංහල සමාජ සංවිධානය" කෘතියේ සඳහන් කරයි. ආනන්ද කුමාර ස්වාමි පවසන්නේ මෙය ගජබා රජුගේ සොළි ජය ග්‍රහණය මූර්තිමත් කරන බවය. සරත්

ඍතුවෙන් පසු වස්සාන ඍතුව (සිංහල විශ්ව කෝෂයට අනුව ඇසළ මස දේව උත්සව සමයකි) ඇරඹෙන්නේ ඇසළ පෝයේ සිටයි. එම නිසා ඈත අතීතයේ පටන්ම දෙවියන් උදෙසා විවිධ පුද පූජා උත්සව පැවතුණ අතර ගජබා සමයේ සිට මෙරට ප්‍රචලිත වුවකි පත්තිනි ඇදහිල්ල. පත්තිනි හෑල්ලේ එන,

"ඇසළ මසට කෙළි පුද අරගන්නේ"

යන වැකියෙන් පත්තිනි පූජාවන් ද ඇසළ කාලයට සම්බන්ධ වී ඇත. කිත්සිරි මෙවන් රාජමසයේ දී දළදා උත්සවයද ඇසළ උත්සවය හා සම්බන්ධ වී ඇත. එසේම බුද්ධ චරිතයේ එන ප්‍රථම දේශනය, ලංකා ඉතිහාසය සම්බන්ධ රුවන් වැලි සෑයේ ධාතු නිධානය හා වස් කාලයේ ආරම්භය යනාදිය නිසා ඇසළ උත්සවය බෞද්ධ මුහුණු වරක් ගන්නට විය. එහි වැදගත් සන්ධිස්ථානයක් නම් මහනුවර යුගයේ ඇසළ දේව පෙරහැර හතරට මුලින් දළදා පෙරහැර ද කීර්ති ශ්‍රී රාජ සිංහ රජතුමා විසින් එකතු කිරීම. මේ අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් මේ දක්වාම ලංකා ඉතිහාසයේ ඓතිහාසිකව සංවර්ධනය වූ වැදගත් උත්සවයක් වශයෙන් ඇසළ උත්සවය සඳහන් කළ හැකිය.

ඇසළ සමයේ ඇරඹෙන උත්සව මාලාවේ අවසාන භාගයේ එන කඨින චීවර පූජෝත්සවය ද ප්‍රකට ය. 3 වන දල්ලමොග්ගල්ලාන රජතුමා ලක්දිව සියලුම ආරාමයන්ට කඨින චීවර පූජා කළ බව මහාවංශයේ 44 පරිච්ඡේදයේ 48 වන ගාථාව මහාවංශය සඳහන් වේ. අග්‍රබෝධි රාජ සමයේ වස්දානය දුන් බව ද සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජු කඨින සිවුරු පූජා කළ බවද, කෝට්ටේ ජයවර්ධන පුර පැරකුම්බා රජු, කීර්ති ශ්‍රී රාජසිංහ, මහනුවර යුගයේ රජුන්ද නොකඩවා කළ බෞද්ධ ආගමික උත්සවයකි කඨිනය. කෝට්ටේ පැරකුම්බා රජතුමා කඨිනානිශංස නම් කෘතියක් රචනා කිරීමෙන් එය කොතරම් ජනප්‍රිය වීද යන්න ප්‍රකට වේ.

"භික්ඛුනං දීපවාසිනං - සබෙබසං චීවරං අදා
අවාසෙසු ච සබෙබසු කඨිනං අත්ථරාපයි"

වස් සමයත් සමග සම්බන්ධ වන තවත් වැදගත් උත්සවයකි ආර්යවංශ දේශනාව. ක්‍රි.ව 5 වන සියවසට කලින්ද ඉන්පසුවද එය ජනප්‍රිය දේශනාවක් වූ බව රාහුල හිමි පවසයි.(P280) එය ඉන්දියාවෙන් මෙරටට අශෝක සමයේ එන්නට ඇතැයි අශෝකගේ භාබ්රෑ ලිපියේ සඳහන් වන "අලියවසානි" යන වචනය අනුව උන්වහන්සේ සිතති. සරණංකර සඟරජුගේ ශිෂ්‍ය බැමුණිය වත්තේ උන්නාන්සේ ආර්යවංශ සූත්‍රයට සන්නයක් කළ බව සංඝරාජ සාධු චර්යාවේ සඳහන් වීමෙන් එය මහනුවර යුගයේ ද තිබුණු බව සිතීමට ඉඩකඩ තිබේ. වර්තමානයේ පවා මෙම උත්සවය පස් යොදුන් කෝරළයේ ගරුළ බැද්ද අසල අලුතෙන් සොයා ගන්නා ලද ගුහා විහාරයක මෑතක දී පවත්වන ලද බවත් එසේම දිඹුලාගල විහාරයෙහි මේ සූත්‍රය දේශනා කරන ලද බවත් රාහුල හිමි තවදුරටත් පවසයි.

භික්ෂු ආභාෂයෙන් සිංහලයන් සතු වූ සිංහල අවුරුදු සැණකෙළියද පුරාණයේ පටන්ම පැවත එන්නකි. එහි පැරණිකම නිසාම ඓතිහාසික වටිනාකම මේ මේ කියා අගයකොට විදහා පෑම දුෂ්කර බව නන්ද දේව ජයසේකර "තෝරා ගත් ලිපි සංග්‍රහය" කෘතියේ P iii දක්වයි. මේ උත්සවය වටා ආගමික ජාතික හා ක්‍රීඩක වශයෙන් වෙලී පවත්නා අංශ රාශියකි. ඒවා අද දක්වාම ඉටු කරනු දක්නට ලැබේ. ආගමික චාරිත්‍ර නම් ක්‍රි.පූ 3 වන සියවසින් පසු සිංහලයන් සතු වන්නට ඇති බව කල්පණා කළ හැකිය. දියකෙළි හා දඩකෙළි සඳහා යොදාගෙන තිබුණු පොසොන් සමය මහින්ද ගමනයෙන් පසු මිහිඳු හිමියන් සමරන බෞද්ධයන් අනුරාධපුරයට එක් රොක් වී පිං දහම් ආදි කටයුතු වල නියැලීමට පුරුදු පුහුණු වූ බව පෙනේ. මහසෙන් පුත් සිරිමෙවන්

රජතෙමේ මිහිඳු මාහිමියන් නමින් අලුත් පූජෝත්සවයක් ආරම්භ කළේය. උන්වහන්සේගේ ශරීර ප්‍රමාණයට රන් පිළිරුවක් කරවා වප් මස පුර පසළොස්වක් දා මිහින්තලේ අඹතලා වෙහෙරට වැඩම කරවීය. මෙම උළෙල මතු එන රජදරුවන්ද අවුරුදු පතා පැවැත් විය යුතු යැයි නියෝගයක්ද කරන ලදි. එතැන් පටන් රජවරුන් එය පිළිපැද්ද බවත් ශත වර්ෂ 9 යක් ඉක්ම වූ පසුත් ඒ උළෙල පැවැත්වුණු බව මහාවංශයේ දෙවන කොටසේ ධර්ම කීර්ති හිමි සඳහන් කරයි. 1 වන ධාතුසේන රජු ද මිහිඳු උළෙල කළ බව වාර්තා වේ. මෙය කරන ලද්දේ පොසොන් මස නොව වප් මාසයේය.

සුප්‍රකට ගිරිභාණ්ඩ පූජාව ඇරඹෙන්නේ මහා දාඨික මහානාග රජුගෙනි. මිහින්තලා සෑයේ වැඩ අවසන් කොට ඓතිහාසික සැණකෙළියක් හා සමාන ගිරිභණ්ඩ පූජාවක් කරන ලදි. මෙම උත්සවයේදී බොහෝ භාණ්ඩ පුදන ලදි. මෙම පූජා උත්සවය ඉතිහාස ගත ප්‍රසිද්ධ එකක් වුවද පසුකාලින රජවරු එය කළ බවක් සඳහන් නොවන බව රාහුල හිමි පවසයි.

5 වන ශත වර්ෂයේ මුල් භාගයේ ගංගාරෝහණ පූජාව ආරම්භ කරන ලද්දේ බුද්ධදාස රජුගේ පුත් 1 වන උපතිස්ස රජු විසිනි. ලක්දිවට පැමිණි තුන්බිය දුරු කිරීම පිණිස රනින් බුදුරුවක් තනවා පිරිත් පැන් පාත්‍රයක් අතෙහි තබා එය රථයක නංවා භික්ෂු සංඝයා හා රජුද රට වැසියන්ද සිල් සමාදන්ව පිරිත් කියමින් රථය පසු පස යති. මහාවංශයේ 37 වන පරිච්ඡේදයේ 141-148 ගාථා වලින් විස්තර වේ.

"ගංගා රෝහණ සුත්තස්ස - උප්පත්තිං තත්‍ථනිද්දසුං
සුත්‍වා තං සබ්බසොවණ්ණං - බිම්බං සම්බුද්ධ ධාතුනො"

මීට සමාන උත්සවයක් 2වන සේන රජතුමා විසින්ද කරන ලද අතර 5 වන කාශ්‍යප රජුද කරන ලදි. නමුත් මුල් ආකාරයෙන්ම ගංගාරෝහණ උත්සවයට සමානව කළාද යන්න පැහැදිලි නැත. සමහර විට මෙම පිරිත් උත්සවය යම් වෙනසකට භාජනය වන්නට ඇත. අනුරාධපුර සමයේ අවසානය වන විට පිරිත් උත්සව බහුලව පැවැති බව එස්. කේ ජයවර්ධන කියයි. 19 වන සියවසේ මැද භාගයේ දකුණු ලක මාතර ගංගාරෝහණ නමින් පූජෝත්සවයක් පැවැත් වූ බව තෝමස් මුහන්දිරම් විසින් ලියන ලද ගංගාරෝහණ වර්ණනාව නම් සිංහල කෘතියේ විස්තර වන බව රාහුල හිමි පවසයි ( අධෝ ලිපිය P290)

බුද්ධෝත්පත්තිය සිහිකිරීම සඳහා මැයි මාසයේ පවත්වනු ලබන බෞද්ධ උත්සවයකි වෙසක්. පාහියන් වාර්තා කරන අන්දමට අවුරුද්දක් පසා දෙවනි මස අටවෙනිදා අති උත්කර්ෂවත් පෙරහැරක්ද පවත්වා කරන ලද්දකි මෙය. ඉන්දියානු ලිතේ හැටියට දෙවනි මාසය නම් වෙසක්ය. එම නිසා පාහියන් වාර්තා කරන ඉන්දිය උත්සවය වෙසක් උත්සවය විය යුතු බව රාහුල හිමි පවසයි. ලංකාවේ වෙසක් උත්සවය මුලින්ම පවත්වන ලද්දේ ඓතිහාසික සාධක අනුව නම් දුටුගැමුණු රාජ සමයේය. එතුමා වෙසක් මඟුල් 24 කළ බව මහාවංශයේ පරිච්ඡේද 32 කියයි. 35 ගාථාව

"මහා විසාඛ පූජාව චතුවීසති කාරයිං
දීපෙ සංඝසස තික්ඛත්තුං තිච්වරමදපයි "

නමුත් මීට පෙරද එය පැවැත් වූ බව සිතිය හැක. එතුමාගෙන් පසු භාතිය 28 ක්ද, වසභ 24 ක්ද වෝහාර, තිස්ස, ගෝඨාභය රජවරුන්ද අඛණ්ඩව කළ බෞද්ධ උත්සවයකි. අශෝක රජතුමා පෙරහැර පවත්වමින් වෙසක් උත්සවය කළ බව 4 වන සෙල්ලිපියේ සඳහන් වේ. පැරණි වෙසක් උත්සව වල වැදගත් ලක්ෂණයක් වන්නේ වීථි සැරසිලි, තොරණ් මෙන්ම වෙසක් පෙරහැරයි.

රාජාභිෂේකය ද මෙරට ක්‍රමයෙන් සංවර්ධනය වූ උත්සවයකි. දෙවන පෑතිස් සමයට පෙර පැවතියේ ඉතා චාම් රාජාභිෂේකයක් බව පණ්ඩුකාභය රාජ ප්‍රාප්තියගැන මහාවංශයේ 10 වන පරිච්ඡේදයේ 77-78 ගාථා වලින් එන විස්තරයෙන් පෙනේ. එහිදී අවශ්‍යම අංගයක් වූයේ ක්ෂත්‍රිය කාන්තාවකි. රජතුමා රට පාලනය කළේ යෂ්ටියකිනි. නමුත් දෙවනපෑතිස් රජුට අශෝක රජු විසින් නියම රාජාභිෂේකයට අවශ්‍ය බඩු එවන ලදි. ඉන්පසු දෙවන වරටත් අභිෂේක ලැබීම අති උත්කර්ෂවත්ව සිදු කෙරුණි. එහිදී ආගමික වශයෙන් සම්බන්ධ වන්නේ කාලි පබ්බත නම් බ්‍රාහ්මණයාය. මුලදී රාජ්‍යයේ ලෞකික කටයුත්තක් වූ අභිෂේකය පසු කලෙක ආගමික උත්සවයක ස්වරූපය ගත්තේය. මහාවංශයේ 10 වන පරිච්ඡේදයට අනුව අභිෂේකයට අවශ්‍ය භාජන සඳහා මැටි ගත යුත්තේ බෞද්ධ සිද්ධස්ථාන වලිනි. 9 වන ශත වර්ෂයේ දී මෙ උත්සවය විහාරස්ථානය තුළම පැවැත් වූ බව 2වන සේන රුවන් වැලිසෑයේ තම අභිෂේකය කිරීමෙන් ප්‍රකට වේ. මහාවංශයේ 51 වෙනි පරිච්ඡේදයේ 82 ගාථා,

"අභිසෙකං ගහෙත්වාන -හෙමවාලුක චෙතියෙ
අනුසංවච්ඡරං කාතුං - තං චාරිත්තං ලිඛාපයි"

මෙම චාරිත්‍රය නොකඩවා කළ යුතු බවද සඳහන් කර තිබේ. මේ අනුව රාජාභිෂේක උත්සවය මුල පටන් වර්ධනය වී ඇති අයුරු පෙනේ.
ලංකාවේ පැවති තවත් උත්සවයකි ආදහනෝත්සවය. මුලින්ම පරිනිර්වාණ සූත්‍රයේ බුද්ධ පරිනිර්වාණයෙන් පසු මිහිඳු හිමියන්ගේ ආදහනෝත්සවය ලක් වැසියන්ට වැදගත් විය. එය ඉතාමත් උත්කර්ෂවත්ව සිදු වූ බව මහාවංශ 2වන පරිච්ඡේදයේ 36 ගාථාවේ සිට වාර්තා වේ.

"ථේරදේහං ඛිපාපෙත්‍වා තං දෝණිං සාධු ඵුස්සිතං
සොවණ්ණ කූටාගාරම්හි ඨපාපෙත්වා අලඞ්කතෙ"

ක්‍රි.ව 5 වන ශතවර්ෂයේදී ලංකාවේ භික්ෂු ආදහනයක් ගැන වටිනා විස්තරයක් සපයන්නේ පාහියන් භික්ෂුවය. ඒ අනුව එදා ආදහන උත්සවය ද ප්‍රකටය. ඍග්වේදීය වෛදික සාම්ප්‍රදායික හින්දු චාරිත්‍රයක් වන දෙවියන් පිදීමේ අග්‍රශෂ්‍යදනය අනුව යමින් ලක්වැසියන් විසින් ද කතරගම ප්‍රදේශයේ අලුත් සහල් මංගල්‍ය කරනු ලබයි. මුරුතැන් පූජාවට පෙර කොටසක් බුද්ධ පූජාව පැවැත් වීම ඓතිහාසිකව සංවර්ධිත ලක්ෂණයකි. අනුරාධපුර හා මහනුවර පළාත්වල බෞද්ධයන් පවත් වන "අග්‍රශෂ්‍යදනය" මීට සමානය. එය හින්දු චාරිත්‍රයට අනුව පසු කාලීන බෞද්ධයන් බෝධිය හා දළඳ වහන්සේ සම්බන්ධ කොට ගෙන කරන ලද්දක් බව අලුත්වැව සෝරත හිමි පවසයි. (කතරගම පුද සිරිත්)

4 වන මිහිඳු රජුගේ ඉතාමත් ප්‍රකට මිහින්තලා සෙල්ලිපියේ "සොම්නස් මහා බෙර මඟුල" හා "රුවනසුත් මහා බෝ මඟුල" කියා උත්සව 2ක් සඳහන් වේ. ශ්‍රී මහා බෝධියේ රෝපණ කටයුතු සාර්ථකව හමාරවීමෙන් පසු ඇතිවූ සොම්නස පදනම් කොට ගෙන දෙවන පෑතිස් සමයෙන් ඇරඹි මෙම උත්සවය වාර්ෂිකව බෝධිහාර පිරිස පවත්වා ගෙන ආ අතර 4වන මිහිඳු රජු විසින් ඊට මුදල් වෙන් කොට ස්ථාපිත කරන ලදි. එසේම "රුවනසුත් මහා බෝ උළෙල" ද බෝමැඩ සම්බන්ධ වජ්‍රාසනය හා සම්බන්ධ ව කරන ලද්දකි.

මේ අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ලංකාවේ විවිධ උත්සව පැවැති බව ප්‍රකට වේ. එසේම බුදු දහම පැමිණීමෙන් පසු සමහර උත්සව බෞද්ධ මුහුණුවරක් ගත් අතර සමහර උත්සව අභාවයට ගොස් තිබේ. බුදු දහම විසින් ම ප්‍රකට කරන ලද බෞද්ධ උත්සව ද වර්තමාන ලක්වැසියා සතුය. මේ අනුව ප්‍රාග් බෞද්ධ හා බෞද්ධ සමහර උත්සව පමණක් ඓතිහාසිකව සංවර්ධනය වූ බව ප්‍රකට වී යයි.

__ආශ්‍රිත ග්‍රන්ථ__


i. වල්පොල රාහුල හිමි, ***"ලක්දිව බුදුසමයේ ඉතිහාසය"***

ii. එස් .කේ .ජයවර්ධන, ***"පැරණි ලංකාවේ ආගමික හා පුද පූජා"***

iii. මහාවංශය, පරිච්ඡේද ,5,14,44,37,32,10,51,02

iv. දඨාවංස, පරිච්ඡේද 5

v. නන්ද දේව ජයසේකර ***"තොරාගත් ලිපි සංග්‍රහය"***

vi. Tissa Kariyawasam, ***"Buddhist Ceremonies and Rituals of Sri Lanka"***

vii. 'බෝධි පුරාණය' ධම්මරක්ඛිත හිමි, ***2300 වසරක මිහිඳු සංස්කෘතිය***

viii. එදිරිවීර සරච්චන්ද ***,ගැමි නාටක පෙරවදන***

***ix.*** පරණ විතාන, ***Sigirgraphitic Introduction Vol. I***

x. රුැල්ෆ් පීරිස් ***, සිංහල සමාජ සංවිධානය***

***xi.*** අලුත් වැව සෝරණ හිමි ***, කතරගම පුද සිරිත්***